09

ඵලදායී ශිෂ්‍ය කේන්ද්‍රීය ඉගෙනුමක් ලෙස ක්ෂේත්‍ර අධ්‍යයන චාරිකා ක්‍රමවේදයේ වැදගත්කම

ජී.කේ. මලිති සංදීපනී

අධ්‍යාපන පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය

සාරසංක්ෂිප්තය

සාම්ප්‍රදායික ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියක දී ගුරුවරයාගෙන් ශිෂ්‍යයන්ට දැනුම ගලායන අතර එමඟින් බිහි වනුයේ නිෂ්ක්‍රීය සිසුන් පිරිසකි. එහෙත් සැබෑ ඉගෙනීම යනු ශිෂ්‍යයා තව දුරටත් නිෂ්ක්‍රීය මට්ටමක සිටීම නොව ශිෂ්‍යයන් තවත් ශිෂ්‍යයන් හා ගුරුවරුන් සමඟ සුසංවාද ගොඩ නගමින් ඒ හා බැඳුණු ශිෂ්‍ය අත්දැකීම්, අත්හදා බැලීම් හා ක්‍රියාකාරකම්වලින් යුක්ත වීමකි. ශිෂ්‍යයන්ගේ කායික සහ මානසික කුසලතා, ඔවුන්ගේ ආකල්ප වෙනසකට තුඩු දෙන ක්‍රියාදාමයක් විය යුතු ය. එහෙත් තවමත් වර්තමාන පන්ති කාමර තුළ ගුරු කේන්ද්‍රීය අධ්‍යාපනය මිස ගුරු ශිෂ්‍ය සංවාදාත්මක, බුද්ධිමය කුසලතා, ආකල්ප වර්ධනය වන ශිෂ්‍ය කේන්ද්‍රීය අධ්‍යාපනයක් දැක ගැනීමට හැකියාවක් ඇත්තේ අවම වශයෙනි. මෙමඟින් තවදුරටත් කට පාඩම් ඉගෙනීමක් විභාග කේන්ද්‍රීය අධ්‍යාපනයක් උද්දීපනය කරන අතර ශිෂ්‍යයන්ගේ තාර්කික බුද්ධිය මොට කරන අධ්‍යාපන රටාවක් පෝෂණය කරයි. නවීන අධ්‍යාපන ක්‍රමවේදය යටතේ ශිෂ්‍ය කේන්ද්‍රීය ඉගෙනුම ප්‍රමුඛ අරමුණක් බවට පත්වී ඇත. ඒ සඳහා වඩාත් සුදුසු ඉගෙනුම් ක්‍රමවේදයක් වශයෙන් ක්ෂේත්‍ර අධ්‍යයන ක්‍රමවේදය හඳුනා ගත හැකි ය. මෙම ලිපිය මඟින් ඵලදායී ශිෂ්‍ය කේන්ද්‍රීය ඉගෙනුම් ක්‍රමවේදයක් ලෙස ක්ෂේත්‍ර අධ්‍යයන චාරික ක්‍රමවේදය ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියට වැදගත්වන ආකාරය තවදුරටත් විමර්ශනශීලී ව සාකච්ඡාවට ලක් කරනු ඇත.

මුඛ්‍ය පද:

ක්ෂේත්‍ර අධ්‍යයන චාරිකා, ශිෂ්‍ය කේන්ද්‍රීය ඉගෙනුම, අත්දැකීම්මය ඉගෙනුම, ක්‍රියාකාරී ඉගෙනුම

ක්ෂේත්‍ර අධ්‍යයන චාරිකාවක් යනු

ක්ෂේත්‍ර අධ්‍යයන චාරිකා යනුවෙන් හඳුන්වන්නේ පන්ති කාමරය තුළ දී වියුක්ත ව ඉගෙන ගන්නා සංකල්ප පිළිබඳ ව සංයුක්ත අත්දැකීම් හෙවත් පංචේන්ද්‍රියගත අත්දැකීම් ලබා ගැනීමට අවකාශ සලසනු පිණිස ඒ දේවල් පිහිටි ස්වභාවික පරිසරයන් වෙත සිසුන් ප්‍රවේශ කරවීමයි. ක්ෂේත්‍ර අධ්‍යයන චාරිකා සෑම විට ම විෂය නිර්දේශයට අදාළ ව පන්ති කාමරයෙන් බැහැර ව සැබෑ පරිසරයකට ගොස් කරුණු නිරීක්ෂණය කරමින් ලබා ගැනීම සහ තොරතුරු රැස් කිරීමේ අධ්‍යාපනික ක්‍රියාවලියක් වශයෙන් හඳුනාගත හැකි ය. ක්ෂේත්‍ර අධ්‍යයන මඟින් ශිෂ්‍යයන් සජීවී අත්දැකීම් ලබා ගැනීමට ඉඩකඩ සලසා ගන්නා අතර එය ප්‍රායෝගික මෙන් ම සිද්ධාන්ත එකිනෙකට සම්බන්ධ කර ගන්නා ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදයක් වශයෙන් ද හඳුනාගත හැකි ය. අධ්‍යාපනය

විෂය පථය පන්ති කාමරයේ පවත්නා සීමා ඉක්මවා විහිදෙන බව නවීන අධ්‍යාපනික ප්‍රවේශ මඟින් අවධාරණය කරන සංකල්පයකි. ශිෂ්‍ය කේන්ද්‍රීය ඉගෙනුම් ප්‍රවේශයක් තුළ සිසුන්ගේ ස්වයං අධ්‍යයන හැකියාවන්, විවේචනාත්මක චින්තනය සහ සැබෑ ලෝකයේ ගැටලු විසඳීමේ කුසලතා වර්ධනය කිරීම අරමුණු කර ගනිමින් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සාර්ථක කර ගැනීම සඳහා ක්ෂේත්‍ර අධ්‍යයන චාරිකා ප්‍රවේශය අතිශය වැදගත් කාර්යභාරයක් ඉටුකරයි.

සාම්ප්‍රදායික දේශන සාකච්ඡා ක්‍රමය ඇතැම් ඉගෙනුම් සංකල්පයන්ට ශිෂ්‍යයන්ට ළඟා වීමට පහසුවක් සැපයුව ද ප්‍රායෝගික සන්දර්භයක් තුළ ඉගෙනුම් සංකල්පවලට ශිෂ්‍යයන්ට ළඟා වීමට නම් සජීවී ඉගෙනුම් අත්දැකීම් ලබාගත හැකි ක්‍රමවේද භාවිත කිරීමට පාසල් පන්ති කාමර තුළ දී ගුරුවරුන් වඩාත් සැලකිලිමත් විය යුතු ය. ක්ෂේත්‍ර අධ්‍යයන චාරිකා මඟින් සිසුන්ගේ කුතුහලය, අධ්‍යාපනය සඳහා තවදුරටත් පෙලඹවිය හැකි වීම සහ ඉගෙනීමේ උද්‍යෝගය පවත්වා ගත හැකි ය. ඔවුන් ඉගෙන ගත් දේ සිහිපත් කිරීමට උපකාරී වන ප්‍රායෝගික අත්දැකීම් ඇතුළත් ඉගැන්වීමේ ප්‍රවේශයක් වශයෙන් ද මෙය හඳුනාගත හැකි ය. එය ශිෂ්‍යයන්ට ඒකාකාරී ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදයෙන් පරිබාහිර වූ නව්‍ය අත්දැකීම් සමඟින් ඉගෙනුම් මාරුවක් ද සිදුවන අවස්ථාවකි. ක්ෂේත්‍ර අධ්‍යයන චාරිකා ශිෂ්‍යයන්ගේ ක්‍රියාකාරී ඉගෙනුම ප්‍රවර්ධනය කරන අතර සැබෑ ජීවිතයේ ගැටලූ විසඳා ගැනීමට සිසුන් සම්බන්ධ කරගන්නා බවත් සාම්ප්‍රදායික පන්ති කාමර සැකසුම් හා සසඳන විට වඩා හොඳ දැනුම රඳවා තබා ගැනීමේ මාධ්‍යයක් වශයෙන් ද ක්ෂේත්‍ර අධ්‍යයන චාරිකා හඳුනාගත හැකි ය.

ස්ටීවන් ජේකොබ් ඔනියෙක්පේ (Stephen Jacob Onyekpe) සහ බෙනර්ඩ් ඔග්බෙමුඩියාරේ (Benard Ogbemudiare) පවසන පරිදි සමාජ අධ්‍යයන වැනි ප්‍රායෝගික විෂයන් ඉගෙන ගැනීමේ දී ඒවායේ පවතින සංකීර්ණතා සම්පූර්ණයෙන් ම ග්‍රහණය කර නොගත හැකි අතර එය බොහෝ විට පන්ති කාමරයෙන් පිටත වඩාත් හොඳින් අත්විඳිය හැකි සැබෑ ලෝක යෙදුම් ඇතුළත් වේ. එහි ප්‍රතිඵලයක් ලෙස ක්ෂේත්‍ර චාරිකා උපදේශන උපාය මාර්ග සිසුන්ට ඔවුන්ගේ වටපිටාව සමඟ සෘජු ව අන්තර් ක්‍රියා කළ හැකි අත්දැකීම් සහිත ඉගෙනුම් පරිසරය සම්බන්ධ කර ගන්නා ගතික විකල්පයක් ලෙස මතු වී තිබේ. පන්ති කාමරයක් තුළ සියලු ම ළමුන් එකට එකවර ඉගෙනුම ලබන ක්‍රමය සාමූහික ක්‍රමය වශයෙන් හඳුනාගත හැකි ය. ඒ අනුව ක්ෂේත්‍ර අධ්‍යයන චාරිකා ද මෙවැනි වූ සාමූහික ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදයක් වශයෙන් හඳුනාගත හැකි ය. පර්යේෂණ සිදු කිරීම, නිරීක්ෂණ සිදු කිරීම, සටහන් තැබීම, කණ්ඩායම් වැඩ, සංවාද, විශ්ලේෂණ සහ අත්දැකීම් මත ඉගෙනුම යන සියල්ල කරා සෘජුව ම පියවර තබන ක්‍රමයක් වශයෙන් ක්ෂේත්‍ර අධ්‍යයන චාරිකා අපිට හඳුනාගත හැකි ය.

ක්ෂේත්‍ර අධ්‍යයන චාරිකා සිදු කළ හැකි විෂය ක්ෂේත්‍ර

ක්ෂේත්‍ර අධ්‍යයන චාරිකා සංවිධානය කිරීමේ දී වඩා යෝග්‍ය පාඩම් ආවරණය කිරීම සඳහා පමණක් යොදා ගත යුතු ය. භූගෝල විද්‍යාව, ඉතිහාසය, විද්‍යාව, කෘෂි විද්‍යාව, ව්‍යාපාර අධ්‍යයනය සහ දේශපාලන විද්‍යාව වැනි විෂයන්ගේ ඇතැම් විෂය කොටස් ආවරණය සඳහා ක්ෂේත්‍ර අධ්‍යයන වඩාත් වැදගත් වේ.

- භූගෝල විද්‍යාව - ගංඟා නිම්න, තෙත් කලාපීය වනාන්තර, වියළි කලාපීය වනාන්තර, කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව, ආපදා කළමනාකරණ දෙපාර්තමේන්තුව

- ඉතිහාසය - පුරාවිද්‍යාත්මක ස්ථාන, නටබුන්, ඓතිහාසික ලෙන්, ගල් පර්වත, කෞතුකාගාර, ආගමික සිද්ධස්ථාන
- විද්‍යාව - උද්භිද උද්‍යාන, සත්ත්ව උද්‍යාන, ජල විදුලි බලාගාර, සුළං විදුලි බලාගාර
- කෘෂි විද්‍යාව - හරිතාගාර, වී නිෂ්පාදන මධ්‍යස්ථාන, සත්ත්ව ගොවිපළවල්
- ව්‍යාපාර අධ්‍යයනය හා ආර්ථික විද්‍යාව - කොටස් වෙළඳපොළ, මහ බැංකුව
- දේශපාලන විද්‍යාව - පාර්ලිමේන්තුව, පළාත් සභා, පළාත් පාලන ආයතන
- සන්නිවේදන හා මාධ්‍ය අධ්‍යයනය - රූපවාහිනී සංස්ථාව, ගුවන් විදුලි සංස්ථාව, චිත්‍රපටි සංස්ථාව සහ අනෙකුත් පිළිගත් මාධ්‍ය ආයතන

ක්ෂේත්‍ර අධ්‍යයන චාරිකා ඵලදායී කිරීමේ ක්‍රමවේදය

ක්ෂේත්‍ර අධ්‍යයන චාරිකාවක් වඩාත් ඵලදායී වීමට නම් සැලසුම් කිරීම, ක්‍රියාවට නැංවීම හා සමාලෝචනය යන පියවර සියල්ල ම ගුරුවරුන් ඉතාමත් වගකීම් සහගතව සිදු කළ යුතු ය. එහි දී ක්ෂේත්‍ර චාරිකාවක් සැලසුම් කිරීමේ දී පහත පියවර අනුගමනය කළ යුතු ය. විශේෂයෙන් ම අධ්‍යාපන අමාත්‍යාංශය විසින් නිකුත් කර ඇති (51/2023) නවතම චක්‍රලේඛනය අනුව පාසල් අධ්‍යාපන චාරිකා සම්බන්ධයෙන් අවශ්‍ය උපදෙස් ලබා දී ඇත. ඒ අනුව පාසල් ගුරුවරුන් එම චක්‍රලේඛනය අනුව අධ්‍යාපන චාරිකා සැලසුම් කළ යුතු ය.

1. **සැලසුම්කරණය හා සංවිධානය**
    - අධ්‍යයන චාරිකාවට වඩාත් ම යෝග්‍ය ස්ථාන තෝරා ගැනීම.

අධ්‍යයන චාරිකාවක් සංවිධානය කිරීමේ මූලික පියවර වන්නේ ඉගෙනුම් අරමුණු සාක්ෂාත් කර ගැනීමට සුදුසු ස්ථානයක් තෝරා ගැනීමයි. එම ස්ථානය විෂය මාලාවේ අන්තර්ගතය හා සෘජුව සම්බන්ධ විය යුතු ය. උදාහරණයක් ලෙස භූගෝල විද්‍යාව සඳහා ජලාශ, කර්මාන්තශාලා කෘෂිකාර්මික මධ්‍යස්ථාන හෝ ජෛව විවිධත්වයක් සහිත කලාප තෝරා ගත හැකි ය. එමෙන් ම තෝරා ගන්නා ස්ථානය සිසුන්ගේ වයස, දැනුම් මට්ටම, ආරක්ෂාව, ගමන් පහසුව සහ වියදම් මට්ටමට සරිලන ස්ථානයක් විය යුතු ය.

- අධ්‍යයන චාරිකාවට අදාළ ආයතනයේ හෝ දෙපාර්තමේන්තුවේ උපදෙස් අධ්‍යයනය කිරීම.

අධ්‍යයන චාරිකාවක් සිදු කිරීමට නියමිත ආයතනය හෝ දෙපාර්තමේන්තුව විසින් නිකුත් කර ඇති නීති, රෙගුලාසි සහ මාර්ගෝපදේශ අධ්‍යයනය කළ යුතු ය. ඇතැම් ආයතනවලට පෙර ලියාපදිංචි වීම, විශේෂ අවසර ලබා ගැනීම හෝ කණ්ඩායම් ප්‍රමාණ සීමා කිරීම වැනි නියම තිබිය හැකි ය. මෙම උපදෙස් පිළිපැදීමෙන් චාරිකාව අතරතුර ඇතිවිය හැකි අපහසුතා අවම කර ගැනීමටත් එම ආයතනය සමඟ යහපත් සම්බන්ධතාවයක් පවත්වා ගැනීමටත් හැකියාව ලැබෙනු ඇත.

- චාරිකාවට අදාළ අධ්‍යාපන බලධාරීන්ගෙන් සහ විදුහල්පතිගේ අවසරය ලබා ගැනීම.

පාසල් අධ්‍යයන චාරිකාවක් සංවිධානය කිරීමේ දී අදාළ අධ්‍යාපන කලාප, පළාත් අමාත්‍යාංශ මට්ටමේ චක්‍රලේඛන අනුව අවශ්‍ය අනුමැතිය ලබා ගැනීම අනිවාර්ය වේ. එසේ ම විදුහල්පතිවරයාගේ නිල අනුමැතිය ද ලබා ගත යුතු ය. මෙම අවසර ලබා ගැනීම මඟින් චාරිකාව නීත්‍යනුකූල හා විධිමත් ක්‍රියාවලියක් බවට පත්වන අතර සිසුන්ගේ ආරක්ෂාව සහ වගකීම පිළිබඳ නිසි කළමනාකරණයක් ද තහවුරු කර ගත හැකි ය.

- අධ්‍යයන චාරිකාව සම්බන්ධයෙන් රාජකාරී මට්ටමින් ලේඛන සකස් කිරීම.

චාරිකාවක් සාර්ථක ව ක්‍රියාත්මක කිරීම සඳහා ලේඛනමය සැලසුම්කරණය අත්‍යවශ්‍ය වේ. ඒ සඳහා චාරිකාවේ දිනය, කාල සටහන, ගමන් මාර්ගය, සහභාගි වන සිසුන් සහ ගුරුවරුන්ගේ නාම ලේඛන, අධ්‍යාපනික අරමුණු සහ අපේක්ෂක ප්‍රතිඵල පැහැදිලි ව සකස් කළ යුතු ය. තව ද ප්‍රවාහන වියදම්, ආහාරපාන, ප්‍රවේශපත්‍ර සහ අනෙකුත් වියදම් ඇතුළත් අයවැය ලේඛනයක් සකස් කිරීම ද වැදගත් ය. මෙවැනි සැලසුම් මඟින් කාලය හා සම්පත් කාර්යක්ෂම ව කළමනාකරණය කළ හැකි ය.

- චාරිකාව පිළිබඳව දෙමවුපියන් දැනුවත් කිරීම සහ ඒ සඳහා දෙමව්පියන්ගේ අවසරය ලිඛිත ව ලබා ගැනීම.

අධ්‍යයන චාරිකාවක් යෑමට පෙර සිසුන්ගේ දෙමවුපියන් චාරිකාවේ අරමුණු, ගමන් මාර්ගය, කාල සටහන, වියදම් සහ ආරක්ෂක කටයුතු පිළිබඳ ව ප්‍රමාණවත් ලෙස දැනුවත් කළ යුතු ය. මේ සඳහා ලිපියක් හෝ රැස්වීමක් මඟින් තොරතුරු ලබා දිය හැකි ය. දෙමවුපියන්ගේ ලිඛිත අවසරය ලබා ගැනීම මඟින් සිසුන්ගේ සහභාගිත්වය පිළිබඳ නිල එකඟතාව තහවුරු වන අතර හදිසි අවස්ථාවක දී සම්බන්ධ විය යුතු තොරතුරු ද ලබා ගත හැකි ය.

- සිසුන්ගේ ආරක්ෂාව, ආහාරපාන, ප්‍රථමාධාර සහ හදිසි තත්ත්වයන්ට මුහුණ දීමට සලසුම් සකස් කිරීම.

අධ්‍යයන චාරිකාවක දී ප්‍රමුඛ අවධානය යොමු කළ යුතු කරුණ වන්නේ සිසුන්ගේ ආරක්ෂාවයි. ඒ සඳහා ප්‍රමාණවත් ගුරු අධීක්ෂණයක් සැපයීම, හදිසි සම්බන්ධතා තොරතුරු රැස් කිරීම, ප්‍රථමාධාර පෙට්ටියක් සූදානම් කිරීම සහ ආසන්න වෛද්‍ය පහසුකම් පිළිබඳ තොරතුරු ලබා ගැනීම අත්‍යවශ්‍ය වේ. එසේ ම ශිෂ්‍යයන්ට පිරිසිදුව ආහාරපාන හා පානීය ජලය සැපයීම ද නිසියාකාරයෙන් සැලසුම් කළ යුතු ය. අනපේක්ෂිත තත්ත්වයන්ට මුහුණ දීම සඳහා විකල්ප සැලසුම් සකස් කර තිබීම චාරිකාවේ සාර්ථකත්වයට වැදගත් වේ.

- චාරිකාව සඳහා සිසුන් රැගෙන යා යුතු ද්‍රව්‍ය සම්බන්ධයෙන් ඔවුන් දැනුවත් කිරීම.

චාරිකාවේ ස්වභාවය අනුව සිසුන්ට අවශ්‍ය ද්‍රව්‍ය මොනවා ද යන්න පිළිබඳව පෙර දැනුම් දිය යුතු ය. එහි දී සටහන් පොත්, පෑන්, නිරීක්ෂණ පත්‍රිකා, ජල බෝතල්, ආහාරපානල අවශ්‍ය ඖෂධ, හිස් වැසුම්, වැසි ආවරණ හෝ වෙනත් උපකරණ රැගෙන යාම පිළිබඳ උපදෙස් ලබා දිය යුතු ය. තව ද ඇතැම් ආයතන හා ස්ථාන සඳහා රැගෙන යාමට ලබා නො දෙන ද්‍රව්‍යයන් ද තිබිය හැකි ය. එවිට අදාළ ආයතනයෙන් ඒ සම්බන්ධයෙන් විමසා

සිසුන් ව පූර්වයෙන් දැනුවත් කිරීම අත්‍යවශ්‍ය වේ. උදාහරණයක් වශයෙන් ස්මාට්ෆෝන්, තියුණු උපකරණ වැනි දෑ රැගෙන නො යන ලෙසට සිසුන්ට උපදෙස් ලබා දිය යුතු ය.

- චාරිකාව අතරතුර සහ පසුව සිසුන් සිදු කරන ක්‍රියාකාරකම් සැලසුම් කිරීම.

අධ්‍යයන චාරිකාවක අධ්‍යාපනික වටිනාකම් ඉහළ නැංවීම සඳහා පෙර සැලසුම් කළ ක්‍රියාකාරකම් තිබිය යුතු ය. චාරිකාව අතරතුර නිරීක්ෂණ වාර්තා සම්පූර්ණය කිරීම, දත්ත රැස් කිරීම, ප්‍රශ්න විමසීම සහ කණ්ඩායම් සාකච්ඡා වැනි ක්‍රියාකාරකම් සැලසුම් කළ හැකි ය. චාරිකාවෙන් පසු වාර්තා ලිවීම, ඉදිරිපත් කිරීම් සිදු කිරීම, පෝස්ටර් නිර්මාණය කිරීම හෝ ප්‍රතිචාර සටහන් සකස් කිරීම වැනි පසු කාර්යයන් ද සංවිධානය කළ යුතු ය. මෙවැනි ක්‍රියාකාරකම් හරහා අත්දැකීම් දැනුම බවට පරිවර්තනය වන අතර ඉගෙනුම් ප්‍රතිඵල තවදුරටත් තහවුරු වේ.

2. ක්‍රියාත්මක කිරීම

- සැලසුමට අනුව සියලු ම ක්‍රියාකාරකම් හැසිර වීම සහ අවශ්‍ය ම අවස්ථාවක පමණක් එය සංශෝධනය කළ හැකි ය.

පෙර සැලසුම් කරන ලද කාලය, නැරඹුම් ස්ථාන, අධ්‍යයන කාර්යයන් සහ ගමන් මාර්ගය නිසි පරිදි අනුගමනය කිරීමෙන් චාරිකාවේ අරමුණ ඉටු කරගත හැකි ය. එහෙත් කාලගුණික තත්ත්ව, ආරක්ෂක හේතු, අනපේක්ෂිත අවස්ථා මත පදනම් ව පමණක් අවශ්‍ය සංශෝධන සිදුකළ යුතු ය.

- සිසුන් සිදු කළ යුතු කාර්යය, කාල සීමා ආරක්ෂක නීති රීති ගුරුවරුන් නැවත නැවතත් මතක් කිරීම සිදු කළ යුතු ය.

චාරිකාව ආරම්භ කිරීමට පෙර මෙන් ම අවශ්‍ය අවස්ථාවල දී ගුරුවරුන් විසින් සිසුන්ට ඔවුන්ගේ වගකීම්, නිරීක්ෂණ, වාර්තා සටහන් සකස් කිරීමේ ක්‍රම හා ආරක්ෂක උපදෙස් නිවැරදි ව පැහැදිලි ව නැවත නැවත මතක් කළ යුතු ය. මෙය සිසුන්ගේ විනය සහ වගකීම් සහගත හැසිරීම් තවදුරටත් වර්ධනය කරයි.

- නැරඹුම් ස්ථානවල දී විශේෂඥතාවක් සහිත පුද්ගලයන්ගේ මාර්ගෝපදේශ යටතේ ගවේෂණ සිදු කිරීම.

විශේෂයෙන් ම අදාළ ක්ෂේත්‍රයට අදාළ නිලධාරීන්, විද්‍යාඥයන්, පුරාවිද්‍යාඥයන්, පරිසරවේදීන් හෝ වෙනත් විශේෂඥයන්ගේ දැනුම ලබා ගැනීමෙන් සිසුන්ට පොත්පත්වලින් පමණක් ලබා ගත නො හැකි ප්‍රායෝගික හා යථාර්ථවාදී දැනුමක් අත්කර ගත හැකි ය.

- සිසුන්ගේ ආරක්ෂාව සම්බන්ධයෙන් නිරන්තර අවධානයෙන් සිටීම.

සිසුන්ගේ ආරක්ෂාව සම්බන්ධයෙන් නිරන්තර අවධානයෙන් සිටීම ගුරුවරුන්ගේ ප්‍රමුඛතම වගකීමකි. සිසුන්ගේ පැමිණීම සනාථ කිරීම, කණ්ඩායම් වශයෙන් ගමන් කිරීමට උපදෙස් දීම, අනතුරුදායක ස්ථානවල දී විශේෂ අවධානය යොමු කිරීම සහ හදිසි අවස්ථා සඳහා සූදානම්ව සිටීම අත්‍යවශ්‍ය වේ.

- ක්ෂේත්‍ර චාරිකාව සෑම විට ම අධ්‍යාපන චාරිකාවක අරමුණින් සිදු කළ යුතු අතර චාරිකාව අතර වාරයේ එය විනෝද ගමනක් බවට පත් වීමට ඉඩ නො තැබිය යුතු ය.

සිසුන්ගේ අවධානය ඉගෙනුම් කාර්යයන් වෙත යොමු කරමින් නිරීක්ෂණ, දත්ත රැස්කිරීම්, සාකච්ඡා සහ වාර්තාකරණ කටයුතු සඳහා වැඩි ප්‍රමුඛතාවක් මෙහි දී ලබා දිය යුතු ය.

ක්ෂේත්‍ර අධ්‍යයන චාරිකා මඟින් ශිෂ්‍ය කේන්ද්‍රීය ඉගෙනුමට ලැබෙන ප්‍රතිලාභ

ශිෂ්‍ය කේන්ද්‍රීය ඉගෙනුම යනු දැනුම ලබා දීමට වඩා දැනුම ගොඩනඟා ගැනීමට සිසුන්ට මඟ පෙන්වීමයි. ක්ෂේත්‍ර අධ්‍යයන චාරිකා මඟින් ද මෙම ප්‍රවේශය තවදුරටත් තහවුරු කරයි. සාම්ප්‍රදායික පන්ති කාමර ඉගෙනුම බොහෝ විට නිෂ්ක්‍රීය විය හැකි නමුත් ක්ෂේත්‍ර අධ්‍යයන චාරිකා සිසුන් සක්‍රීය සහභාගිත්වයට යොමු කරයි. ක්ෂේත්‍ර අධ්‍යයන චාරිකාවක දී සිසුන් තමන් ඉගෙන ගන්නා දේ සහ ඉගෙන ගන්නා ආකාරය පිළිබඳ වැඩි වගකීමක් භාර ගනියි. ගවේෂණය ක්‍රියාවලියේ දී ඔවුන්ගේ කුතුහලය ඔවුන්ගේ ඉගෙනීමේ උත්තේජනය බවට පත්වෙයි. චාරිකාවට පෙර චාරිකාව අතරතුර සහ චාරිකාවෙන් පසු සිදු කරනු ලබන ක්‍රියාකාරකම් නිසා නිෂ්ක්‍රීය ග්‍රාහකයන් නොවන සක්‍රීය ක්‍රියාකාරී ගවේෂකයන් බවට ශිෂ්‍යයන් පත්වන බව පැහැදිලි ය. පන්ති කාමරයේ දී වියුක්ත ලෙස උගන්වන සංකල්ප ක්ෂේත්‍ර ආධ්‍යයන චාරිකා මඟින් සැබෑ ලෝකය ක්‍රියාත්මක වන ආකාරය සෘජුව දැකීමට සිසුන්ට අවස්ථාව ලැබෙයි. උදාහරණයක් ලෙස භූගෝල විද්‍යාව තුළ ගංගාවක් පිළිබඳ ඉගෙන ගන්නා ශිෂ්‍යයා ක්ෂේත්‍ර අධ්‍යයන චාරිකාවක් මඟින් ගංගා නිම්නයකට ගොස් පාංශු බාදනය වන ආකාරය සහ නැවත පස් තැන්පත් වන ආකාරය පිළිබඳ ව සෘජු ව නිරීක්ෂණය කිරීමේ හැකියාව ලබයි.

ඔවුන් ලබා ගන්නා මෙම සෘජු ඵලදායී ඉගෙනුම් අත්දැකීම් සිසුන්ගේ දිගු කාලීන මතකය තුළ තවදුරටත් තැන්පත් වේ. ක්ෂේත්‍ර අධ්‍යයන චාරිකාව මඟින් ශිෂ්‍යයන් තොරතුරු විශ්ලේෂණය කිරීමට සහ තමන්ගේ ම නිගමනවලට එළඹීමක් සිදුකරයි. එමෙන් ම ඔවුන්ගේ විවේචනාත්මක චින්තනය සහ ගැටලූ විසඳීමේ කුසලතාවන් ද වර්ධනය වේ. ක්ෂේත්‍ර අධ්‍යයන චාරිකාවක් මඟින් විෂය කරුණුවලට අමතර ව සමාජ කුසලතාවන් ද වර්ධනය වීම සිදුවේ. එනම් ක්ෂේත්‍ර අධ්‍යයන චාරිකාව සැලසුම් කර ඇත්තේ කණ්ඩායම් ක්‍රියාකාරකම් වශයෙන් නම් ඔවුන්ගේ කණ්ඩායම් අතර සහයෝගිතාව ද වර්ධනය වේ. එනම් කණ්ඩායමක් ලෙස තොරතුරු රැස් කිරීම, නිරීක්ෂණ සිදු කිරීම, ගැටලූ හඳුනා ගැනීම සහ වාර්තා සකස් කිරීම වැනි කාර්යයන්හි නිරත වීමෙන් ශිෂ්‍යයන් අතර සහයෝගීතාව, සන්නිවේදනය හැකියාව සහ කණ්ඩායම් හැඟීම වර්ධනය වේ. එසේ ම විවිධ අදහසක් මතවාද ඉදිරිපත් කරන සාමාජිකයන් සමඟ කටයුතු කිරීමේ දී අන්‍යයන්ගේ අදහස්වලට ගරු කිරීම, විවිධත්වය පිළිගැනීම සහ ගැටුම් සාමකාමීව විසඳා ගැනීම වැනි සමාජීය ගුණාංග ද වර්ධනය වේ.

තව ද කණ්ඩායම් නායකයෙකුගේ මග පෙන්වීම යටතේ ක්‍රියා කිරීමෙන් නායකත්වයට ගරු කිරීම මෙන් ම අවශ්‍ය අවස්ථාවල දී නායකත්ව වගකීම් භාර ගැනීමේ හැකියාව ද ශිෂ්‍යයන් තුළ ඇති වේ. තව ද වගකීම් බෙදා ගැනීම, තීරණ ගැනීම, ගැටලු විසඳීම සහ කාල කළමනාකරණය වැනි කුසලතා ද වර්ධනය වෙයි. මේ අනුව ක්ෂේත්‍ර අධ්‍යයන චාරිකා ශිෂ්‍යයන්ගේ දැනුම පමණක් නොව 21වන සියවසේ අත්‍යවශ්‍ය කුසලතා ලෙස සැලකෙන සහයෝගීතාව, සන්නිවේදනය, විවේචනාත්මක චින්තනය, නායකත්වය සහ සාමූහික වගකීම් වැනි හැකියා ද සංවර්ධනය කරන ඵලදායී ශිෂ්‍ය කේන්ද්‍රීය ඉගෙනුම් ක්‍රමවේදයක් ලෙස හඳුනා ගත හැකි ය.

ක්ෂේත්‍ර අධ්‍යයන චාරිකා ක්‍රමවේදයේ දී ඇතිවිය හැකි අභියෝග සහ ඒ සඳහා විසඳුම්

ක්ෂේත්‍ර අධ්‍යයන චාරිකා පන්ති කාමරයෙන් බැහැරව සැබෑ ලෝකය සමඟ සම්බන්ධ වෙමින් අත්දැකීම් මඟින් සිසුන් ඉගෙනුම ලබන ඉතාමත් ප්‍රබල ශිෂ්‍ය කේන්ද්‍රීය ක්‍රමවේදයකි. ඒ අනුව මෙහි සාර්ථකත්වය රඳා පවතින්නේ එමඟින් මතුවන අභියෝග කළමනාකරණය ගන්නා ආකාරය මතයි.

1. මූල්‍ය සහ සම්පත් ආශ්‍රිත අභියෝග - ක්ෂේත්‍ර අධ්‍යයන චාරිකාවක් සංවිධානය කිරීමේ දී ප්‍රවාහනය, ආහාරපාන සහ අත්‍යවශ්‍ය කටයුතු සඳහා සැලකිය යුතු පිරිවැයක් දැරීමට සිදුවේ. මෙය ඇතැම් විට පන්තියේ සිටින අඩු ආදායම්ලාභී සිසුන්ට බාධාවක් විය හැකි ය. එබැවින් පාසල් සංවර්ධන සමිතියේ, ආදි ශිෂ්‍ය සංගම් මඟින් අරමුදල් සොයාගැනීම හා දුර බැහැර ස්ථාන වෙනුවට අවම පිරිවැයකින් ළඟාවිය හැකි අධ්‍යාපනික වටිනාකමක් සහිත ප්‍රදේශ තෝරා ගැනීමේ හැකියාවක් පවතී.

2. ආරක්ෂාව සහ විනය පවත්වාගෙන යාම - පන්ති කාමරයෙන් බැහැර පරිසරයක දී සිසුන්ගේ ආරක්ෂාව තහවුරු කිරීම සහ ඔවුන්ගේ විනය පාලනය කිරීම ගුරුවරුන් මුහුණ දෙන ප්‍රධාන අභියෝගයක් බවට පත් ව තිබේ. ඒ සඳහා චාරිකාවට පෙර සිසුන් සහ දෙමාපියන් දැනුවත්කර පැහැදිලි උපදෙස් මාලාවක් ලබාදිය යුතු ය. සෑම ශිෂ්‍යයෙක් ම කණ්ඩායම් ගත කර ඔවුන්ට වගකීම් පැවරිය යුතු ය. විශේෂයෙන් ම ප්‍රාථමික අංශයේ සිසුන්ට අධ්‍යාපන චාරිකාවක් සූදානම් කරන්නේ නම් ස්වේච්ඡා දෙමව්පියෙක් අනුයුක්ත කිරීම ද සිදුකළ යුතු ය. එමෙන් ම ප්‍රථමාධාර සහ හදිසි සම්බන්ධතා ජාලයක් සූදානම් කර තබාගත යුතු ය.

3. කාල කළමනාකරණය - ක්ෂේත්‍ර අධ්‍යයන චාරිකා සඳහා වැඩි කාලයක් ගතවන බැවින් සුදුසු කාල සටහනකට අනුව චාරිකාවේ නැවතුම්පොළවල් සහ එහි දී සිදු කරන ක්‍රියාකාරකම් සැලසුම් කළ යුතු ය.

4. ඉගෙනුම් අරමුණු කෙරෙහි අවධානය ගිලිහී යාම - සිසුන් මෙවැනි ක්ෂේත්‍ර අධ්‍යයන චාරිකාවක නිරත වීමේ දී ඔවුන් නිරන්තරයෙන් ලබන සාම්ප්‍රදායික පන්ති කාමර අත්දැකීමට එහා ගිය ඉතාමත් සක්‍රීය ඉගෙනුම් අත්දැකීමක් ලබනු ඇත. එවැනි අවස්ථාවක දී අධ්‍යාපනික කරුණුවලට වඩා විනෝදය කෙරෙහි ඔවුන්ගේ වැඩි අවධානයක් යොමු වීමට අවකාශය ඇත. මෙම තත්ත්වය වළක්වා ගැනීම සඳහා සෑම ශිෂ්‍යයෙකුට ම සම්පූර්ණ කළ යුතු වැඩ පත්‍රිකාවක් හෝ නිරීක්ෂණ සටහන් ලබා ගැනීමට

ගුරුවරයා විසින් උපදෙස් ලබාදිය යුතු ය. අත්දැකීම් මත පදනම් ව ඉදිරිපත් කළ යුතු ව්‍යාපෘතියක්, වාර්තාවක් හෝ පැවරුමක් ලබාදීමට ද ගුරුවරයා විසින් කටයුතු කළ යුතු ය.

5. පරිපාලන සහ නීතිමය බාධා - විශේෂයෙන් ම ක්ෂේත්‍ර අධ්‍යයන චාරිකාවක් සැලසුම් කිරීමේ දී අදාළ අධ්‍යාපන බලධාරීන්ගෙන් අවසර ලබා ගැනීමේ නීතිමය ක්‍රියාදාමය නිසි අයුරින් සිදු කළ යුතු ය.

සමාලෝචනය

ක්ෂේත්‍ර අධ්‍යයන චාරිකා ඉගෙනුම් ක්‍රමවේදය යනු සාම්ප්‍රදායික අධ්‍යාපන ක්‍රමයෙන් බැහැරට ගොස් සිසුන්ට සක්‍රීය ව ඉගෙනීමට න්‍යායාත්මක දැනුම රැස් කිරීමට සැබෑ ලෝකයට සම්බන්ධ කිරීමයි. ඒ අනුව ක්ෂේත්‍ර අධ්‍යයන චාරිකා යනු හුදෙක් විනෝද චාරිකා නොවන අතර ශිෂ්‍යයාගේ පෞරුෂය සහ බුද්ධිය වර්ධනය උදෙසා භාවිත කළ හැකි සක්‍රීය ඉගෙනුම් උපාය මාර්ගයකි. ක්ෂේත්‍ර අධ්‍යයන චාරිකාවක් වඩාත් ඵලදායී කර ගැනීම සඳහා ගුරුවරයා විසින් සැලසුම්කරණය හා සංවිධානය, ක්‍රියාත්මක කිරීම සහ සමාලෝචන අවධි නිසි පරිදි සංවිධානය කළ යුතු ය. අනෙකුත් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේද හා සසඳා බලන කළ ක්ෂේත්‍ර අධ්‍යයන චාරිකා ක්‍රමවේදයේ දී ඇතිවිය හැකි ගැටලු සහ අභියෝග වෙනස්වන නිසා ඒ පිළිබඳ ව ගුරුවරයාට පූර්ණ අවබෝධයක් තිබිය යුතු අතර ඒවා සඳහා උචිත විසඳුම් ගැනීම මගින් ක්ෂේත්‍ර අධ්‍යයන චාරිකා ක්‍රමවේදය තවදුරටත් සාර්ථක කර ගත හැකි ය. මෙම ඉගෙනුම් ක්‍රමවේදයෙන් ශිෂ්‍යයන් ඔවුන්ගේ අධ්‍යාපන කටයුතු සාර්ථක කර ගන්නේ කෙසේ ද යන්න සහ එහි ප්‍රතිලාභ සම්බන්ධයෙන් නිරන්තරයෙන් ම ශිෂ්‍යයන්ව දැනුවත් කිරීම ගුරුවරයගේ කාර්යයභාරයකි. මෙවැනි ක්‍රමවේදයක් මගින් ඔවුන් ලබා ගන්නා සජීවී ඉගෙනුම් අත්දැකීම් ශිෂ්‍යයන්ගේ සමස්ත ජීවිතයට ම අතිශය වැදගත් වේ. එය ශිෂ්‍යයා තුළ ඉගෙනීමට ඇති උනන්දුව වැඩි කරන අතර ම විෂය කෙරෙහි ප්‍රායෝගික දෘෂ්ටිකෝණයකින් බැලීමට ද මඟ පාදයි.

ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය

බණ්ඩා, ඩී. එම්. ටී. (2007). *අධ්‍යාපනික නාක්ෂණ විද්‍යාව*. ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

පොන්නම්පෙරුම, ජී. (2022, අගෝස්තු 23). ශිෂ්‍ය කේන්ද්‍රිය අධ්‍යාපනය සහ ලාංකේය සාම්ප්‍රදායික අධ්‍යාපන උරුමය. *ගවේෂණය*, *39*, 5–6. https://gaveshana.lk/39_3

අධ්‍යාපන අමාත්‍යාංශය. (2023). *චක්‍රලේඛ අංක 51/2023*. https://moe.gov.lk/wp-content/uploads/2024/08/51-2023-si.pdf

Ogbemudiare, B., & Onyekpe, S. J. (2025). Effectiveness of field trip learning instructional strategy on achievement in social studies among primary school pupils in Delta State. *Kontagora International Journal of Educational Research (KIJER)*, *2*, 308–323. https://doi.org/10.5281/zenodo.14792225